<u>කුරුවිට ප්‍රාදේශීය සභාව</u>

<u>රත්නපුර දිස්ත්‍රික්කය</u>

1. මූල්‍ය ප්‍රකාශන.
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 27 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 10 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කුරුවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වැය විෂයය 108 ට අදාල සමාලෝචිත වර්ෂයේ වියදම රු. 238,833 ක් විය යුතු වුවද, මූල්‍ය ප්‍රකාශන වල ණයහිමි ශේෂය වූ රු. 130,108 ක් පමණක් ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම රු. 108,725 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වැය විෂයය 203 ට අදාල සමාලෝචිත වර්ෂයේ වියදම රු. 1,363,334 ක් විය යුතු වුවද, මූල්‍ය ප්‍රකාශන වල එකී ශේෂය රු. 1,644,741 ක් වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම රු. 281,407 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල රු. 47,500 ක් ණයහිමියන් වෙනුවෙන් වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන මඟින් ගැලපීම් කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ ණයහිමියන් සඳහා ගෙවීම් සිදු කිරීමේදී රු. 1,281,977 ක අධි වෙන්කිරීම් සම්බන්ධයෙන් අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුලදී ජ'නල් සටහන් මඟින් ඌණ/අධි බිල්කිරීම් සමුච්චිත අරමුදලට ගැලපීමේදී රු. 105,309 ක් වැඩියෙන් ගලපා තිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 08 කට අදාලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ සහ උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ වෙනස රු. 63,022,715 ක් විය.

(ආ) වැය ලෙජරය හා ඒකාබද්ධ වැය සාරාංශය අතර වැය විෂයයන් 02 කට අදාල රු. 22,823,774 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| 132 (ඒ) වගන්තිය | ප්‍රජා පිළිගැනීම හෝ පොදු වැදගත් කටයුත්තක් හෝ සිද්ධියක් හෝ අවස්ථාවක් පිළිබඳව හෝ වියදම් සඳහා එක් වර්ෂයකට රු. 1,000 ඉක්මවන වියදම් සඳහා අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත්, ඊට පටහැනිව අවස්ථා 08 කදී එකතුව රු. 96,767 ක වියදම් දරා තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි 371(2) | සමාලෝචිත වර්ෂය තුලදී අධ්‍යාපන චාරිකාවක් වෙනුවෙන් ලබාදෙන ලද රු. 200,000 ක අත්තිකාරම් මුදලක් විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 අප්‍රේල් මස වනවිටත් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ 2005 ජුනි 08 දිනැති අංක 1396/18 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය | සභා රැස්වීම් සඳහා සහභාගී නොවූ එක් සභිකයෙකු සඳහා අවස්ථා 05 කදී රු. 25,000 ක් වූ මුදලක් සභික දීමනා ලෙස ගෙවා තිබුණි. |
| (ඈ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| | 2.8.4 හා 8.12.3 | පෙරපාසල් සඳහා බෙදාදීමට රු.597,920 ක් වටිනා විදුලි උපකරණ, ගෘහ භාණ්ඩ හා ක්‍රිඩා උපකරණ මිලදී ගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවක නිර්දේශ ලබාගෙන නොතිබු අතර අදාල පිරිවිතරයන්ට අනුකූලව මිලදී ගත් බවට අදාල නිළධාරියෙකුගේ සහතික කිරීමක්ද නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 17,172,231 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,451,340 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 2,084 | 1,751 | 4,320 |
| බදු කුලී | 5,261 | 5,011 | 5,710 |
| බලපත්‍ර ගාස්තු | 1,271 | 1,625 | - |
| වෙනත් ආදායම් | 8,746 | 26,533 | 3,881 |

### 2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම් හා රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, වරෙන්තු හා දඩ සහ වෙනත් ආදායම් වල ඇස්තමේන්තුගත ආදායමට වඩා රැස්කල අදායමෙහි පිළිවෙලින් සියයට 46, සියයට 58, හා සියයට 36 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

### 2.2.3 බදු කුලී

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කුරුවිට නගරයේ නව වෙළඳපල කඩකාමර 36 ක් අතරින් කඩකාමර 08 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මාස 01 සිට වර්ෂ 05 දක්වා හිඟ රු. 1,351,500 ක කුළී මුදල් සහ ඊට අදාල අධි ගාස්තු ලෙස රු. 3,621,500 ක මුදලක් අයකර ගැනීමට සහාව කටයුතු කර නොතිබුණි.

(ආ) කඩකාමර 07 කින් වර්ෂ 04 ක කාලයක් ඉක්මවා අයවිය යුතු කුළී මුදල රු. 1,350,000 ක් වූ අතර, එය අයවිය යුතු මුළු හිඟයෙන් සියයට 97 ක ප්‍රතිශතයක් විය. මේ අතරින් එක් පුද්ගලයෙකුට හිමි කඩකාමර තුනකින් අයවිය යුතු මුදල රු. 696,000 ක් වැනි වැඩි අගයක් ගෙන තිබූ බව නිරීක්ෂණය විය. කඩ කාමර දෙකකින් අයවිය යුතු මුදල සම්බන්ධයෙන් 2010 නොවැම්බර් සිට බලපැවැත්වෙන පරිදි මාසික බදු කුළිය රු. 1,500 බැගින් සංශෝධනය කර තිබුණි.

(ඇ) තාවකාලික කඩකාමර අතුරින් අවුරුදු 01 ට වැඩි කාලයක් හිඟ කුළී පවතින කඩකාමර සංඛ්‍යාව 03 ක් වූ අතර, ඉන් අයවිය යුතු මුදල අධි ගාස්තුවද ඇතුළුව රු. 158,190 ක් විය.

(ඈ) ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව අනුව නව ගොඩනැගිල්ලේ කඩකාමර සඳහා අත් මුදල් සහ ගාස්තු සංශෝධනය කර තිබූ අතර, බිම් මහලේ කඩකාමර 07 ක් සඳහා විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 අප්‍රේල් මස වන තුරුත් රු. 6,343,861 ක අත් මුදල් අයකරගෙන නොතිබුණි. එම කඩකාමර සඳහා අත් මුදල් සහ ගාස්තු සංශෝධනය කිරීමෙන් පසු එම අත් මුදල් අඩු කිරීම සඳහා ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතියට ඉදිරිපත් කර තිබූ අතර, අදාල අනුමැතිය ලැබෙන තුරු අත් මුදලින් කොටසක් (½ ක්) අයකිරීමටත්, අනුමැතිය නොලදහොත් ඉතිරි මුදල තක්සේරු වාර්තාව අනුව ගෙවීමටත් 2014 නොවැම්බර් 18 දිනැති සභා තීරණ අංක 6.2.1 මගින් තීරණයක් ගෙන තිබූ නමුත්, එම නියෝගය විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 අප්‍රේල් මස වනතෙක් ක්‍රියාත්මක වී නොතිබුණි.

2.2.4 ප්‍රචාරන දැන්වීම් ගාස්තු

---------------------------

සමාලෝචිත වර්ෂයේදී සභා බල ප්‍රදේශය තුල ස්ථිර දැන්වීම් පුවරු 19 ක් පමණක් හඳුනාගෙන තිබූ අතර, බිත්ති හා තාප්ප උපයෝගී කරගනු ලබන ප්‍රචාරණ දැන්වීම්, රෙදි මගින් කරන ලද දැන්වීම්, ඩිජිටල් මුද්‍රණ දැන්වීම් ආදී වශයෙන් විශාල දැන්වීම් ප්‍රමාණයක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර, ඒවා හඳුනාගෙන ගැසට් නිවේදනය පරිදි ගාස්තු අයකිරීමට සභාව කටයුතු නොකිරීම හේතුවෙන් විශාල ආදායමක් සභාවට අහිමි වී තිබුණි. 2013 වර්ෂයේදී අයකර තිබූ ප්‍රචාරණ දැන්වීම් 2014 වර්ෂයේදී ඉවත් කර තිබුණේද යන්න හඳුනාගෙන නොතිබූ අතර, එසේ පැවතියේ නම් ඒ සඳහා ගාස්තු අයකිරීම සම්බන්ධවද සභාව කටයුතු කර නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා සභාවට ලැබිය යුතු උසාවි දඩ සහ මුද්දර ගාස්තු පිළිබඳව අධීක්ෂණය කර අදාල ලේඛණ යාවත්කාලීන කර නොතිබූ අතර, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව රැස්කර තිබූ ආදායම් පමණක් සභාවේ ලැබූ ආදායම් ලෙස ලේඛණගත කර තිබුණි.

(ආ) පළාත් ආදායම් කොමසාරිස්ගේ 2014 අගෝස්තු 15 හා 2014 නොවැම්බර් 30 දිනැති අංක 27(VII) දරන ලිපි පරිදි 2013 අප්‍රේල් සිට 2014 මාර්තු දක්වා කාලයට අදාල ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ලැබී තිබූ එහෙත් නිසි තහවුරුවක් නොලැබීම හේතුවෙන් සභාවට ප්‍රේෂණය කර නොතිබූ රු. 178,450 ක මුද්දර ගාස්තු ප්‍රමාණය හඳුනා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 විදේශ ගමන් වියදම්

----------------------------

පෞද්ගලික ආයතන විසින් සංවිධානය කරන ලද තායිලන්තයේ දින 05 ක විදේශ සංචාරය සහ ඉන්දියාවේ පැවති 09 වෙනි තරුණ සමුළුව සඳහා ප්‍රාදේශීය සභාවේ සභිකයින් හා ලේකම් සහභාගී වී තිබූ අතර, ඒ සඳහා සහභාගී වූවන් වෙනුවෙන් රු. 1,411,800 ක මුදලක් පෞද්ගලික ආයතන වෙත සභා අරමුදලින් ගෙවා තිබුණි. එම වියදම් දැරීම සඳහා විෂයයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී තිබුණි.

උක්ත සංචාර සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2010 සැප්තැම්බර් 09 දිනැති අංක PL/07/01/05/26 දරන ලිපිය අනුව පළාත් පාලන ආයතන ප්‍රධානියෙකු හෝ නියෝජ්‍ය ප්‍රධානියෙකු හෝ සභිකයෙකු විදේශ පුහුණු වැඩසටහන් සඳහා තෝරා ගන්නේ නම් අදාල සංවිධානය හෝ විදේශ රාජ්‍ය හෝ විදේශ ආයතනයන් ඒ සඳහා වැය වන සියළු වියදම් හා පහසුකම් දැරිය යුතු වුවත්, එම චක්‍රලේඛ විධිවිධාන නොසලකා උක්ත ගෙවීම් කර තිබුණි.

(ආ) විදේශගත වීමට පෙර නිවාඩු අනුමත කරවා ගත යුතු වුවත්, 2014 දෙසැම්බර් 24 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/9/6/1 ලිපිය අනුව තායිලන්ත සංචාර සඳහා විදේශ ගතවූ සභිකයින් දෙදෙනෙකු සඳහා විදේශ නිවාඩු අනුමත වී නොතිබුණි.

(ඇ) තායිලන්ත සංචාරයට සහභාගී වූවන් සඳහා ලබා දී තිබූ එකතුව රු. 516,750 ක අත්තිකාරම් මුදල් පියවා නොතිබුණි.

(ඈ) විදේශ පුහුණුව මඟින් ලබාගත් දැනුම දේශීය වශයෙන් උපයෝගී කරගන්නා ආකාරය පිළිබඳව වාර්තාවක් පුහුණුව අවසන් වී මාසයක් ඇතුලත ලබාදිය යුතු වුවත්, ඉන්දියානු තරුණ සමුළුවට සහභාගී වූ සභිකයින් සංචාරය අවසන් කර මාස 08 ක් පමණ ගතවී තිබුණද, එවැනි වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

3.2 වීදි පහන් සවි කිරිම

------------------------

වීථි පහන් අවශ්‍යතාවය නිසිපරිදි හඳුනාගෙන තාක්ෂණික නිළධාරියාගේ පූර්ව නිර්දේශයකින් තොරව රු. 994,310 ක් වටිනා වීථි පහන් හා බල්බ 2014 වර්ෂය තුල මිලදී ගෙන තිබූණි. ඉහත මිලදී ගැනීම් සම්බන්ධයෙන් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 හා 8.12.3 ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර, මෙම වීථි පහන් හා බල්බ් සවිකිරීම් හා ඉවත් කිරීම් පිළිබඳව නියමිත පරිදි හඳුනාගත හැකි ලෙස වාර්තා තබා ගැනීමක් සිදුකර නොතිබුණි. විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය මඟින් වීථි ආලෝකකරණය සම්බන්ධයෙන් වන උපදෙස් පිළිබඳව සලකා බැලීමකින් තොරව වීථි ආලෝකකරණය ක්‍රියාත්මක වන අතර, වීථි පහන් සවිකිරීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය සමඟ ඇති කරගත් එකඟතාවයන්ද විගණනයට ඉදිරිපත් නොවුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 සහ 2012 වර්ෂයන්හි සිට ඉදිරියට ගෙනඑනු ලබන රු. 3,986,846 ක ණයහිමි ශේෂයක් විගණිත දිනය වනවිටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභා සීමාව තුල පිහිටි සුසාන භූමි අතරින් සුසාන භූමි 42 ක් පමණක් හඳුනාගෙන තිබූ අතර, ඉන් සුසාන භූමි 06 ක් පමණක් පවරා ගෙන තිබුණි. අනෙකුත් ඒවා මැනුම් කටයුතු සිදුකර සභාව වෙත විධිමත් ලෙස පවරාගෙන ලේඛණගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පළාත් පාලන ආයතන වල කසල කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා කසල වෙන්කර එකතු කිරීමේ ජාතික වැඩසටහන යටතේ, 2014 ජූලි 23 දින පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සභාව වෙත ලැබී තිබූ කසල බඳුන් 112 කින් විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 ජූනි මස වනවිට ප්ලාස්ටික් කසල බඳුන් 49 ක් බෙදා නොහැර ගබඩාවේ තැන්පත් කර තිබුණි.

(ඉ) සභාව සතු නාමල්දෙණිය ගිමන්හල 2010 ජනවාරි 01 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා පස් අවුරුදු කාල සීමාවකට නාරාහේන්පිට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය වෙත බදු දී තිබුණි. බදු කාලය අවසන් වීම හේතුවෙන් එම ගිමන්හල 2014 දෙසැම්බර් 02 දින ආපසු භාරදී තිබූ අතර, ගෘහ භාණ්ඩ, සවිකුරු හා විදුලි උපකරණ ද ගිවිසුම් ප්‍රකාරව බදු දී තිබූ අනෙකුත් භාණ්ඩ ද ආපසු භාරදී නොතිබුණි.

4. පද්ධති හා පාලන

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය